# ජනාධිපතිවරණ ප්‍රතිඵලයෙන් නිගමනයක්

පශ්චාත් ජනාධිපතිවරණ තත්වය වැනි ප්‍රකාශ යොදා ගැනීමට තරම් මම බුද්ධිමත් නො වෙමි. පශ්චාත් ප්‍රභාකරන් යුගය පශ්චාත් යුද්ධ තත්වය ආදිය පශ්චාත් නූතනත්වය හා පශ්චාත් නූතනවාදය (ඒ දෙක එකක් නොවන බව අවධාරණය කළ යුතු ය) තරම් ම හිස් ප්‍රකාශ වේ යැයි බුද්ධිමතකු නොවූ මට හැඟෙයි. ඒ කෙසේ වෙතත් ජනාධිපතිවරණය ගැන ලිවිය යුතු තවත් බොහෝ කරුණු ඇත. අපි එයින් කිහිපයක් සාකච්ඡා කරමු. පළමුවෙන් ම සඳහන් කළ යුත්තේ මහින්ද රාජපක්ෂ මහතාගේ ජයග්‍රහණයෙන් මෙරට ස්වෛරීභාවය රැකී ඇති බව ය. සිංහල ජනතාවගෙන්, විශේෂයෙන් ම සිංහල බෞද්ධයන්ගෙන් අති මහත් බහුතරය ඒ මහතාට ඡන්දය දීමෙන් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදීන්ට දී ඇති පණිවුඩය නම් අප රටේ කටයුතුවලට ඇඟිලි නොගසා සිටින ලෙස ය. මෙහි දී පසුගිය දා ගෝඨාභය රාජපක්ෂ මහතා බීබීසි ය සමග පැවැත් වූ සාකච්ඡාවේ දී කියා ඇති කරුණක් සඳහන් නොකර සිටීමට නො හැකි ය. ඒ මහතා කියා ඇත්තේ මෙරට කිසිම පරීක්ෂණයක් විමර්ෂණයක් කිරීමට කිසිම විදේශිකයකුට ඉඩ නොදෙන බව ය. මෙරට සිංහලයන්ගෙන් ඉතා විශාල බහුතරයක් සිතන්නේ ද එසේම ය. ආරක්ෂක ලේකම්තුමාට මේ බහුතර සිංහලයන්ගේ මතය ශක්තියක් වූවා නිසැක ය. සරත් ෆොන්සේකා යනු පැහැදිලිව ම විජාතික බලවේගයේ නියෝජිතයා විය. එහෙත් ඔහු රනිල් කණ්ඩායම මෙන් නොව කොටින්ට එරෙහිව කළ මෙහෙයුම් වෙනුවෙන් පෙනී සිටියේ ය. රනිල් වික්‍රමසිංහ රවි කරුණානායක වැනි බටහිර යටත්විජිතවාදයේ සෘජු ඒජන්තයන් හමුදා මෙහෙයුම්වලට පරිභව කරද්දී සරත් ෆොන්සේකා එකල පාබල හමුදාවට නායකත්වය දුන්නේ ය. මෙහි දී සඳහන් කළ යුතු තවත් කරුණක් වෙයි. ජනවාරි 27 වැනි දා රනිල් සම්බන්ධන් මනෝ ගනේෂන් සෝමහංස වැන්නන් සරත් ෆොන්සේකා සමග හෝටලයකට වැදී කුමක් කෙළේ දැයි නිශ්චිත ව කිව නොහැකි වුවත් එයින් හරියට ම අවුරුදු හතළිස්අටකට පෙර 1962 දී රවි කරුණානායකලාගේ සීයලා පාසල් රජයට පවරා ගැනීමට එරෙහි ව  බණ්ඩාරනායක මැතිනියගේ රජයට විරුද්ධව හමුදා කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට සිටි බව වැඩිහිටි බොහෝ දෙනා දනිති.

අද සරත් ෆොන්සේකා ඇමෙරිකන් රජයේ සාක්ෂිකරුවකු වී ගෝඨාභය රාජපක්ෂ ශවීන්ද්‍ර සිල්වා ප්‍රසන්න සිල්වා ආදී මහත්වරුන් පාවා දී ආරක්ෂක මණ්ඩලයේ තීරණ හෙළිදරවු කිරීමට ඉදිරිපත් වී රාජද්‍රෝහියකු වී සිටිය ද එදා ඔහු “යුද්ධයට” සහභාගි වීමෙන් සිංහලයන්ගේ ගෞරවය දිනා සිටියේ ය. විජාතික බලවේග විසින් ඔහු ජනාධිපතිවරණයට ඉදිරිපත් කෙරුණේ ඒ බව ද සැලකිල්ලට ගැනීමෙනි. විජාතික බලවේගවලට සිටි හොඳම අපේක්ෂකයා ඔහු විය. 2005 ජනාධිපතිවරණය සමග සැසඳීමේ දී සරත් ෆොන්සේකා ලබාගත් ඡන්ද ප්‍රතිශතය අඩු වී තිබුණ ද රනිල් මෙවර ඉදිරිපත් වී නම් ලබාගන්නා ඡන්ද ප්‍රමාණය 32% ට පමණ සීමාවීමට තිබිණි. දළ වශයෙන් ගතහොත් සරත් ෆොන්සේකාට පෙර ප්‍රදර්ශනය කළ ජාතිකත්වය හේතුවෙන් සිංහල ජාතිකත්ව ඡන්දවලින් 8%ක පමණ ප්‍රමාණයක් ආකර්ෂණය කිරීමට හැකි විය. ඒ සියයට අටත් සමග ගතහොත් මහින්ද රාජපක්ෂ මහතාට 66% ක පමණ ඡන්ද ප්‍රමාණයක් ලැබීමට තිබිණි. ජාතිකත්වය අගයන 8% ක පමණ පිරිසක් සරත් ෆොන්සේකාට ඡන්දය දුන්නේ විවිධ බලාපොරොත්තු ඇති කර ගනිමිනි. ඔවුහු සරත් ෆොන්සේකාගේ “යුද්ධයට” ඇති සම්බන්ධය දැන සිටියහ. එය අගය කළහ. එමෙන් ම ඔවුන්ගේ මතය වූයේ සරත් ෆොන්සේකා ඒ ජා ප සහ ජ වි පෙ සමග හංසයා ලකුණින් තරග කළ ද හිටපු ජෙනරාල් අයත් වූයේ සිංහල ජාතිකත්වයට බව ය. ඔහු ජනාධිපතිවරණය ජයග්‍රහණයෙන් පසු රනිල්, සම්බන්ධන් හා මනෝ ගනේෂන් වැන්නන්ට පමණක් නොව ජ වි පෙරමුණට ද රිසි ලෙස රට කරවීමට ඉඩ නොදෙනු ඇතැයි මොවුහු බලාපොරොත්තු වූහ. ඔවුන් සිතුවේ සරත් ෆොන්සේකා ජනාධිපතිවීමෙන් පසුව සිංලත්වයට විරුද්ධ වුවන් දැඩි  මර්දනයකට හසු කිරීමට කටයුතු කරනු ඇති බව ය. ඔවුන්ගේ අදහසට අනුව සරත් ෆොන්සේකා දෙමළ ජාතිවාදය මුළුමනින් ම පරාජය කර සිංහලයන්ට මෙරට හිමි තැන ලබාදීමට කටයුතු කිරීමට තිබිණි. සිංහල ජාතිකත්වය අගයන යම් පිරිසකට එවැනි අදහසක් ලබා දීම නිසා සරත් ෆොන්සේකාට රනිල් වික්‍රමසිංහ ලබාගැනීමට තිබූ ඡන්ද ප්‍රතිශතයට වැඩි ප්‍රතිශතයක් දිනාගැනීමට හැකි විය. එහෙත් සරත් ෆොන්සේකා ගැන කියන මේ ජාතිකත්ව පිරිසට දේශපාලනය ගැන එතරම් අවබෝධයක් නොමැති බව පැහැදිලි ය.

සරත් ෆොන්සේකාට ඔවුන් අදහස් කළ කිසිවක් කිරීමට නොහැකි බව ඔවුහු නො දැන සිටියෝ ය. සරත් ෆොන්සේකා බටහිරයන්ගේ නියෝජිතයා ලෙස ඇමරිකන් රජයේ රාජ්‍ය සාක්ෂිකරුවකු ලෙස බටහිරයන් විශේෂයෙන් ම ඇමරිකානුවන් කියන දෙයක් කිරීමට බැඳී සිටියේ ය. මහින්ද රාජපක්ෂ මහතා බටහිරයන්ට ඇහුම්කන් නොදෙන ඔවුන්ගේ බලපෑම්වලට යටත් නොවන පුද්ගලයකු වන නමුත් ඒ මහතාට ඔවුන් ඉදිරියේ දණ නොනමා සිටීමට ශක්තියක් ඇති නමුත් සරත් ෆොන්සේකා යනු බටහිරයන්ට විරුද්ධව ඇඟිල්ලක් එසවීමට නොහැකි දුර්වල

© Prof. Nalin De Silva

ආත්මාර්ථකාමී තම ගැලවීම සඳහා රට ජාතිය පාවාදීමට සූදානම් පුද්ගලයෙකි. ඔහුට දෙමළ ජාතිවාදය පරාජය කිරීමට කිසිවක් කළ නොහැක්කේ බටහිරයන් එවැන්නකට විරුද්ධ වන බැවිනි. ඔහු සම්බන්ධන්ලා මනෝ ගනේෂන්ලා රාවුෆ් හකීම්ලා සමග එක් වූයේ ද ඔවුන්ගේ කොන්දේසි පිළිගත්තේ ද බටහිරයන්ගේ අවශ්‍යතාව පරිදි ය. අනෙක් අතට මනෝ ගනේෂන්ලා සම්බන්ධන්ලා සරත් ෆොන්සේකාට සහාය දුන්නේ ද ඔවුන්ට බටහිරයන්ගෙන් සරත් ෆොන්සේකා ගැන සහතිකයක් ලැබී තිබුණු බැවිනි. සරත් ෆොන්සේකා හා සම්බන්ධන් අතර වූ ගිවිසුමට සාක්ෂිකරුවන් ලෙස බටහිර රටවල් දෙකක තානාපතිවරුන් අත්සන් තබා ඇත්තේ නිකම් නො වේ.

මහින්ද රාජපක්ෂ මහතාට සිංහල නොවන්නන්ගේ ඡන්ද ලැබී ඇත්තේ 20% ක් පමණ ය. එමෙන් ම පළාත් සභා නිලවරණ සමග සංසන්දනය කිරීමේ දී එක්සත් ජනතා නිදහස් සංධානයේ ඡන්ද ප්‍රතිශතය අඩු වී ඇත. මේ ප්‍රශ්නයට එ ජ නි ස මෙන් ම සිංහල ජනතාව ද තම අවධානය යොමු කළ යුතු ය. පළාත් සභා නිලවරණවල දී තරම් ඡන්ද ප්‍රතිශතයක් ඌව වැනි පළාත් සභා ප්‍රදේශයේ දී නොලැබුණේ එක් පැත්තකින් දෙමළ වතු කම්කරුවන්ගේ ඡන්ද විශාල ප්‍රතිශතයක් මහින්ද රාජපක්ෂ මහතාට මෙවර අහිමි වීම නිසා ය. දෙවනුව සිංහල ජාතිකත්වය අගයන පිරිසක් සරත් ෆොන්සේකාට ඡන්දය දීම නිසා ය. දෙවැන්න සිදුවූයේ කලින් කියා ඇති පරිදි ජාතිකත්වය අගයන පිරිසක් සරත් ෆොන්සේකා පිළිබඳ වැරදි තක්සේරුවක සිටි බැවිනි. එහෙත් දෙවැන්නට හේතුව කවරේ ද? ඌවේ වතු කම්කරුවන් පමණක් නොව නැගෙනහිර පළාතේ දෙමල හා මුස්ලිම් ජනයා මෙවර මහින්ද රාජපක්ෂ මහතාට විරුද්ධව ඡන්දය දුන්හ. එසේ ඡන්දය දුන්නේ නැගෙනහිර උදානය (හා උතුරු වසන්තය) ක්‍රියාත්මක වන අතරතුර ය. එයට ප්‍රධාන හේතු කිහිපයක් තිබේ. අද වතුකරයේ තොන්ඩමන්ට ඇති ආකර්ෂණයක් නැත. සෞම්‍යමූර්ති තොන්ඩමන්ට මෙන් වතුකම්කරුවන් අතර ආකර්ෂණයක් ඔහුගේ මුණුබුරාට නැත. එමෙන් ම ඩග්ලස් දේවානන්දන්, කරුණා හා පිල්ලෙයාන් දෙමළ ජනයා අතර එතරම් ගෞරවයකට පාත්‍ර වූවෝ නො වෙති. ඒ සියල්ල පිටුපස තවමත් ක්‍රියාත්මක වන දෙමළ ජාතිවාදය වෙයි. දෙමළ ජාතිවාදයට අද නායකත්වය ලැබෙන්නේ බටහිර රටවල වාසය කරන විසිරී ඇති දෙමළ ජනයාගෙනි. එහි දී බටහිර යටත්විජිතවාදීන්ගේ සහාය අනුග්‍රහය හා මග පෙන්වීම ඔවුනට ලැබෙයි.

අප මෙය පරාජය කළ යුතු ය. අප ප්‍රභාකරන් සම්බන්ධයෙන් අවුරුදු ගණනාවකට පෙර කී අන්දමට අපට ඉතිරි වී ඇති දෙමළ ජාතිවාදී සුන්බුන් ද අතුගා දැමිය හැකි ය. එසේ කළ හැක්කේ සිංහලයන් සියල්ල ම කෙසේ වෙතත් (රනිල් රවි වැනි බටහිර නියෝජිතයන් කිසි දිනෙක එකතු කරගත නො හැකි ය. එමෙන් ම තමන් සිංහලයන් ලෙස නොසලකන කසිකබල් මාක්ස්වාදී අතළොස්ස ද අද ජ වි පෙ ක්‍රියාකාරීන් ද සරත් ෆොන්සේකා ද තවදුරටත් සිංහලයන් ලෙස නො සැළකිය හැකි වෙයි) 75% ක් පමණ දෙමළ ජාතිවාදය පිළිබඳ එකම මතයකට ගැනීමෙනි. ඒ එතරම් අමාරු කාර්යයක් නො වේ. දැනටමත් සිංහලයන් විශාල ප්‍රමාණයක් එකම මතයකට පැමිණ ඇත. දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම පමණක් මෙරට අසාධාරණයක් සිදු වී නොමැති බව අර කලින් කී අය හැරෙන්නට බොහෝ සිංහලයෝ පිළිගනිති. එසේ ම දෙමළ ජාතිවාදය ඇති වී තිබෙන්නේ බටහිරයන්ගේ අනුග්‍රහය හා සිංහලත්වය නැසීමට බටහිරයන්ට ඇති අවශ්‍යතාව නිසා යන්න ද ජනතාව අවබෝධ කර ගනිමින් සිටිති. ඉංගිරිසි උගත් දෙමළ ජනයාට බ්‍රිතානීන්ගෙන් ලැබුණු වරප්‍රසාද කෙමෙන් අඩුවීම දෙමළ ජනයාට වූ අසාධාරණයක් ලෙස අර්ථකථනය කෙරුණු බව ද ජනතාවට දැන් වැටහෙයි. ඉංගිරිසි උගත් දෙමළ ජනයාගේ විකෘතියක් වෙනුවෙන් පසුව ඉංගිරිසි නුගත් දෙමළ ජනයා යොදාගැණුනු බව ද සිංහලයන්ට අවබෝධ වෙමින් පවතියි. එහෙත් මේ එකක්වත් අද මෙරට වාසය කරන ඉංගිරිසි නුගත් දෙමළ ජනයා පිළිගන්නා බවක් නො පෙනෙයි. අප ඔවුන්ට ඒ බව අවබෝධ කරවන්නේ කෙසේ ද? එයට එක් පිළිතුරක් නම් සිංහල ජාතිකත්වයට එක් පොදු නායකයකු පමණක් සිටීම ය. පළාත්සභා ඡන්දයේ දී සිංහල ජාතිකත්වයට තිබුණේ මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වය පමණකි. එහෙත් සිංහල ජාතිකත්වයට විකල්ප නායකත්වයක් ඇති බව පෙන්වීමට ජනාධිපතිවරණයේ දී විජාතික බලවේග සමත් විය. අද මේ ව්‍යාජ නායකත්වය ඉරානයේ මෙන් බටහිරයන්ගේ අවශ්‍යතාවට ජනාධිපතිවරණ ප්‍රතිඵලයට විරුද්ධව ව්‍යාපාරයක් ආරම්භ කර ඇත. අද අප කළ යුත්තේ බටහිරයන් ඉදිරිපත්කර ඇති ව්‍යාජ නායකත්වයේ වෙස් මුහුණු ගැලවීම ය.

.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva